**නාවික සංවර්ධන අරමුදල - 2013**

**---------------------------------**

නාවික සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමුච්චිත අරමුදලේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීම් තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර විගණන මතය සඳහා පදනම

**-----------------------------------------**---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 අභිතකර විගණන මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට නාවික සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 අරමුදල අවිධිමත් ලෙස පවත්වාගෙන යාම හා නෛතිකව වඩාත් ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබීම .**

නාවික සංවර්ධන අරමුදල පිහිටුවා වසර 39 කටත් වැඩි කාලයක් ගත වී තිබුණද අරමුදල නෛතිකව වඩාත් ශක්තිමත් කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් ඉදිරිපත් කර ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය නීති සම්පාදනය කිරීමට 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම අරමුදලේ පරිපාලනය විධිමත් කිරීම සඳහා මෙතෙක් පාලක මණ්ඩලයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර නාවික ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් කිසිදු දායකත්වයක් ලබාදීමක් හෝ ඒ සඳහා සැලසුම්කිරීමක් මෙම අරමුදල හරහා මේ දක්වා සිදුකර නොතිබුණි. මේ අනුව මෙම අරමුදලේ අඛණ්ඩ පැවැත්මක් නොමැති බව නිරීක්ෂණය වුවත් ඊට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන සඳහා කවර වූ ගිණුම්කරණ ප්‍රමිතියක් අනුගමනය කර තිබුණේද යන්න හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන 04 කින් ලැබිය යුතු එකතුව රු.මිලියන 460 ක් ශේෂ පත්‍රයේ වත්කම් යටතේ දක්වා තිබුණද මෙම මුදල් දීර්ඝ කාලයක සිට ලැබිය යුතු නාමික ශේෂයක් පමණක් විය. කෙසේ නමුත්, මෙම මුදල් ලැබීම අවිනිශ්චිත බැවින් ඒ සඳහා බොල් ණය ප්‍රතිපාදන සැලසීමට හෝ අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) අරමුදලට අයත් එහෙත් වෙනත් ආයතනයක් භාරයේ පවතින පිරිවැය රු.94,598 ක් වූ ස්ථාවර වත්කම් රු.16,342 කින් ක්ෂය කර සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැර තිබුණි.

කෙසේ වෙතත්, ඉහත (අ) හා (ආ) ඡේදවල දැක්වෙන වත්කම් හා ශේෂ සනාථ කිරීම් සඳහා වත්කම් ලේඛණ, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම්, භෞතික සත්‍යාපනය මණ්ඩල වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම වත්කම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

අරමුදල, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සමුච්චිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂයවීම් වශයෙන් දැක්වෙන රු.16,342 ක වියදම පමණක් දරා ඇති බැවින් වර්ෂයේ ඌනතාවය රු.16,342 ක් වී තිබුණි. එහෙයින් ඉකුත් වර්ෂය සඳහා වූ රු. 19,342 ක ඌනතාවයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.3,000 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

කොමිස් මුදල් අයකර ගැනීමට විරුද්ධව නැව් නියෝජිත ආයතන විසින් නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශයට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩුවක් මගින් මුදල් අයකිරීම වලක්වන නියෝගයක් 2006 වර්ෂයේදී ලබා දී තිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමෙන් ලැබූ කොමිස් මුදල් ඉකුත් වසර 6 තුළ ලැබී නොතිබුණි. එමෙන්ම නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශයද ඇවර කර තිබුණි. තවද අරමුදල සතුව ස්ථාවර වත්කම් ලෙස පරිගණක හා ඡායා පිටපත් යන්ත්‍ර කිහිපයක් පමණක් ඇති බැවින්, කවරාකාරයෙන් හෝ මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම , අරමුදලට ගැටළු සහගත වී තිබීමෙන් කිසිදු කාර්ය සාධනයක් වාර්තා කිරීමට අපොහොසත් වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අරමුදල විසින් 2011 ජූනි මාසයේ පිළිවෙලින් රු.35,000,000 ක් සහ රු.25,000,000 ක් වශයෙන් එකතුව රු.60,000,000 ක් නාවික මෙහෙයුම් පර්යන්තයකට අවශ්‍ය උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රාජ්‍ය නාවික සමාගමකට ලබාදී තිබුණි. එම මුදලින් රු.46,476,266 ක් වැයකර භාණ්ඩ මිලදී ගෙන තිබුණු අතර ශේෂය වූ රු.13,523,734 ක් වූ මුදල මාස 14 කට වැඩි කාලයක් නිෂ්කාර්යව බාහිර ආයතනයක තිබීමට ඉඩ දී පසුව එම මුදල 2012 අගෝස්තු 12 වන දින භාණ්ඩාගාරයට ආපසු යවා තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මගී පර්යන්තයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් දැරීමට ලබා දී තිබූ මුදලින් රු.29,686,523 ක් ගොඩනැගිලි කුලී, ප්‍රවාහන, කම්කරු වේතන, විදුලි , දුරකථන හා වෙනත් සුළු වියදම් වැනි පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි.

(ආ) එකතුව රු.11,883,238 ක් වූ මුදලක් වැයකර මිලදී ගෙන තිබූ ගමන් මලු පිරික්සුම් උපකරණ (Baggage Scanner) , ලෝහ භාණ්ඩ හඳුනාගැනීමේ උපකරණ (Metal Detector ) සහ යකඩ ට්‍රොලි කිසිදු ප්‍රයෝජනයක් ලබා නොගෙනම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අය කිරීමකින් තොරව ලබා දී තිබුණි.

(ඇ) එකතුව රු. 4,906,505 ක් වූ පරිගණක හා කාර්යාල ලී බඩු රේඛීය අමාත්‍යාංශයේ සහ රාජ්‍ය නාවික සංස්ථාවක ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි.

එහෙයින් මගී පර්යන්තයක වැඩි දියුණු කිරීම සඳහා ලැබී තිබූ මුදලින් රු.46,476,266 ක් අදාල කාර්යයට නොයොදවා වෙනත් කාර්යයක් සඳහා යොදවා තිබීමෙන් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

**----------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ණයගැතියන්

(ඇ) ස්ථාවර වත්කම්